# නාට්‍ය හා රංගකලාව

අ.පො.ස (සාමාන්‍ය පෙළ ) සිසුන් ඉලකක් කරගත්

## විභාග ආකෘතියට සැකසූ පෙරහුරු පරීක්ෂණ නිබන්ධනය

සමග

## ස්වයං අධ්‍යයනයට උචිත ලෙස සැකසූ සවිස්තරාත්මක කරුණු සහිත පිළිතුරු පත්‍රය




අධීක්ෂණය

නිමල් දිසානායක මයා - (දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යකෂ)

එච්. එම්.චන්ද්‍ර කුමාර මයා - නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යකෂ (සෞන්දර්ය) මාතර කලාපය

නිබන්ධන සැක්සුම

පී.එච්. නදීල් ශ්‍යාමන් - නාට්‍ය හා රංගකලාව ආචාර්ය (ශාරිපුත්‍ර විද්‍යාලය - මාතර)

සමපත් දායක - දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව



දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
මාතර අධ්‍යාපන කලාපය
**SOUTHERN PROVINCE – DEPARTMENT OF EDUCATION**
**ZONAL EDUCATION OFFICE – MATHARA**
අධීක්ෂණය
නිමල් දිසානායක මයා - (දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ)
එච්. එම්.චන්ද්‍ර කුමාර මයා - නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞන්දර්ය) මාතර කලාපය
නිබන්ධන සැකසුම
පී.එච්. නදීල් ශ්‍යාමන් - නාට්‍ය හා රංගකලාව ආචාර්ය (ශාරිපුත්‍ර විද්‍යාලය - මාතර)
සම්පත් ආයක - දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

| නාට්‍ය හා රංගකලාව<br>Drama And Theatre | 11 ශ්‍රේණිය<br>Grade 11 | කාලය පැය 03<br>Time 3 Hr |
|---|---|---|

## නාට්‍ය හා රංගකලාව I

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.**

- පහත ගද්‍ය හා පද්‍ය ඇසුරෙන් 01 සිට 05 දක්වා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A. දුටුවාද ස්වාමි - මාගේ ස්වාමි - ලක්ෂණ මුවයා - ලක්ෂණ මුවයා
වර්ම පුල්ලි පේලි සැදී - නේත්‍ර මාගේ ප්‍රීති වේවි.

B. ගවසම්පත් බෝ වේවා - ගහකොළ පලදා වේවා
ගජකුළු බිය නැති වේවා - ගණ දෙවි නුවණක් දේවා

C. අන්දම් කරුවලේ සෙහොනේ සිටින්නේ
අන්දමකින් රෑ සිහිනෙන් පෙනෙන්නේ
පන්දම් යගදාව ගෙන කරකවන්නේ
පන්දම් පාලියට සන්නිය වරෙන්නේ

D. සැම තරුණන්ගේ සිත
මවිත කරවන ලෙසින් දූන් එන
මෙ සබයට දිවුනත
ඒය රුසිරෙන් දිලි පේඩි කත

E. රන්විල රිද්දි විල කෙළිනා බිසවුන්ට
මැණික් විලෙන් දිය නාලා ගොඩ එන්ට
අයවන පුද පඬුරු හෙප්පුව පුරවන්නට
රන් රුව සේම බිසවරු යහනට එන්ට

01. ඉහත කවි /ගීත ඇසුරින් සොකරි නාට්‍යයට අදාළ වනුයේ,
1) A ය 2) B ය 3) C ය 4) D ය

02. ඉහත කවි /ගීත ඇසුරින් කෝලම් නාට්‍යයට අදාළ වනුයේ,
1) B ය 2) C ය 3) D ය 4) E ය

03. ඉහත කවි /ගීත ඇසුරින් නූර්ති නාට්‍යය ගීතයක් වනුයේ,
1) A ය 2) B ය 3) D ය 4) E ය

04. ඉහත කවි /ගීත ඇසුරින් පහතරට ශාන්තිකර්ම සම්ප්‍රදායට අයත් වනුයේ,
1) A හා B ය 2) C හා E ය 3) D හා E ය 4) A හා D ය

05. ඉහත කවි /ගීත ඇසුරින් වෙස්මූණු භාවිතා කරනු ලබනුයේ,
1) ABC ය 2) BCD ය 3) ACD ය 4) CDE ය

06. නාට්‍යමය අවස්ථාවක් ගොඩනැගෙන්නේ,
1) ගැටුමක් නිසා ප්‍රතිවිරුද්ධ ක්‍රියාවලියක් පැවතීමෙන්
2) ප්‍රධාන චරිතය රඟපාන අවස්ථාවකින්
3) තේමාව ප්‍රකාශ වන අවස්ථාවකින්
4) අවස්ථා රැසක් එකතු වීමෙන්

07. නළුවකුට දීර්ඝ සංවාද ඛණ්ඩ නිවැරදිව හා පැහැදිලිව උච්චාරණය කිරීමට උපකාරී වන්නේ,
1) ශිථිලීකරණ අභ්‍යාස 2) ශ්වසන අභ්‍යාස
3) සංවේදන අභ්‍යාස 4) චිත්ත ඒකාග්‍රතාව අභ්‍යාස

08. නාට්‍ය පිටපතක අන්තර්ගත නොවන්නේ,
1) ගැටුම් අවස්ථා 2) රංග විධාන 3) චරිත නිරූපණය 4) සංවාද

09. දර්පන අභ්‍යාස වල යෙදීම තුළින් රූපණ ශිල්පියෙකුට ගොඩ නගා ගත හැකි ශක්‍යතාවයකි.
1) ස්මරණ ශක්තිය ප්‍රබල වීම
2) සාත්වික අභිනය ප්‍රගුණ කර ගැනීමට අවස්ථාවක් ලැබීම
3) සබකෝලය දුරු වීම
4) ක්ෂණිකව ක්‍රියාත්මක වීමේ හැකියාව වර්ධනය කර ගත හැකි වීම

10. නාට්‍යයක් නිර්මාණය කළ පසු එහි පැවැත්ම රඳාපවතිනු ලබන්නේ,
1) ප්‍රේක්ෂක ප්‍රතිචාර මතය
2) නළු නිළියන්ගේ ජනප්‍රියත්වය මතය
3) අනුෂාංගික ශිල්පීන්ගේ සහයෝගය මතය
4) අධ්‍යක්ෂකගේ හා නළු නිළියන්ගේ දැඩි කැපවීම මතය

11. ප්‍රාසංගික කලාවකි,
1) චිත්‍ර 2) මූර්ති 3) කැටයම් 4) බැලේ

12. කතාන්තරයක් යනු,
1) කියවා හා අසා රසවිඳින කලාවකි 2) නරඹා රසවිඳින කලාවකි
3) සාමුහික පිරිසකගේ නිර්මාණයකි 4) සතර අභිනය භාවිතා කරන කලාවකි

13. එදිනෙදා ජිවිතයේ ආයාසයකින් තොරව සිදු කරනු ලබන චලන හඳුන්වනුයේ,
1) නිර්මිත චලන නම්නි 2) ස්වාභාවික චලන නම්නි
3) තාලානුරූප චලන නම්නි 4) රිද්මයානුකුල චලන නම්නි

14. වේදිකා නාට්‍යයකට නැතිවම බැරි දෙදෙනා වනුයේ,
1) ආලෝක ශිල්පියා හා වේශභූෂණ ශිල්පියා 2) පෙල රචක හා අර්ථපති
3) නළුවා හා ප්‍රේෂකයා 4) නිෂ්පාදක හා අංග රචනා ශිල්පියා

15. රංග රචනයේ දී සැලකිලිමත් විය යුත්තේ,
1) ප්‍රධාන චරිත, වේදිකාවේ ස්ථාන සහ චලන රටාය
2) ඉහළ මැද වේදිකාව හා පහළ මැද වේදිකාව පිළිබඳවය
3) වේදිකා අවකාශය නළු නිළි චලන සහ අනුශාංගික කලා පිළිබඳවය
4) මැද වේදිකාව හා තිර පිළිබඳවය

- **පහත දැක්වෙන වගුව ඇසුරෙන් අංක 16 සිට 20 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

| මුල් කෘතිය | මුල් රචකයාගේ නම | පරිවර්තිත කෘතිය | පරිවර්තක |
|---|---|---|---|
| අවුමන් ඔෆ් නෝ ඉම්පෝටන්ස් | ක | වැදගත්කම | හෙන්රි ජයසේන |
| ග | ඇලෙක්සැන්ඩර් බ්‍රෙෆෝව් | මුතු කුමාරි | සුගතපාල ද සිල්වා |
| ලේඩි ෆ්‍රොම් ද සී | හෙන්රික් ඉබ්සන් | ජ | සුනන්ද මහේන්ද්‍ර |
| ඊඩිපස් රෙක්ස් | සොෆොක්ලීස් | ඊඩිපස් රජ | ට |
| The Just | ඇල්බෙයා කැමූ | ඩ | පරාක්‍රම නිරිඇල්ල |

16. ඉහත වගුවේ "ක" කොටුවට ඇතුළත් විය යුතු රචකයාගේ නම කුමක්ද?
    1) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්
    2) සැමුවෙල් බෙකට්
    3) ඔස්කා වයිල්ඩ්
    4) ලුයිඩ් පිරැන්ඩෙලෝ

17. ඉහත වගුවේ "ග" කොටුවට ඇතුළත් විය යුතු මුල් කෘතිය නම් කරන්න.
    1) ඉර්මාලාඩුස්
    2) රූඩන්ස්
    3) ද හෝස්
    4) කැට් ඔන් ද හොට් ටින් රූෆ්

18. ඉහත වගුවේ "ජ" කොටුවට ඇතුළත් විය යුතු පරිවර්තන කෘතිය කුමක්ද?
    1) හුනුවටයේ කතාව
    2) තුරඟ සන්නිය
    3) මනාලයෝ
    4) සයුරෙන් ආ ළඳ

19. ඉහත වගුවේ "ට" කොටුවට ඇතුළත් විය යුතු පරිවර්තකයා කවුරුන්ද?
    1) ආරියවංශ රණවීර
    2) පරාක්‍රම නිරිඇල්ල
    3) මැන්දිස් රෝහණධීර
    4) බන්දුල විතානගේ


20. ඉහත වගුවේ "ඩ" කොටුවට ඇතුළත් විය යුතු පරිවර්තන කෘතිය කුමක්ද?
    1) පුත්‍ර සමාගම
    2) ඇපල් කරත්තය
    3) විනිශ්චය
    4) කඹය

- **පහත ඡායාරූප ඇසුරු කර ගනිමින් 21 සිට 25 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**


ක


ග


ජ


ට


ඩ

21. වීදි රඟන යනුවෙන් විරුධාවලිය ඇති ශිල්පිණිය දැක්වෙන අක්ෂරය වන්නේ,
    1) ක ය  2) ග ය  3) ඩ ය  4) ජ ය


22. බන්දුල විතානගේගේ වැනීසියේ වෙළෙන්දා නාටකයෙන් වේදිකාවට පිවිසි රංගනයට, නර්තනයට හා ගායනයට එක සේ දස්කම් දක්වන ශිල්පිනිය වන්නේ,
    1) ක ය  2) ඩ ය  3) ග ය  4) ජ ය

23. 1967 වේදිකා රංගනයට ප්‍රවිෂ්ඨ වී වේදිකා, රූපවාහිනි, රංගන ශිල්පිනියක මෙන්ම මනා ගායන පෞරුෂයක් හිමි ශිල්පිනිය දැක්වෙන වරණය කුමක්ද?
    1) ඩ ය  2) ක ය  3) ජ ය  4) ග ය

24. "ජ" ඡායාරූපයෙන් දක්වෙන ශිල්පිනිය හා සම්බන්ධ වැරදි ප්‍රකාශය තෝරන්න.
   1) 1993 වර්ෂයේ දී නාට්‍ය ක්ෂේත්‍රයට පිවිසී ඇත.
   2) බොරදිය පොකුණ චිත්‍රපටය උදෙසා හොඳම නිළියක ලෙස ජාත්‍යන්තර සම්මානයට පාත්‍ර විය.
   3) දිරිය මව විකෘති, බර්නාඩාගේ සිපිරිගෙය ආදී නාට්‍ය වල රංග කෞෂල්‍ය විදහා පා ඇත.
   4) වේදිකා හා චිත්‍රපට අධ්‍යක්ෂණය වෙනුවෙන් සම්මානයට පාත්‍ර වී ඇත.

25. "ට" ඡායාරූපය හා සම්බන්ධ වැරදි ප්‍රකාශය කුමක්ද?
   1) ලාංකීය ලෝක ධර්මී නාට්‍ය කලාව ආරම්භ කරන ලද ප්‍රකට නාට්‍යකරුවෙකි.
   2) සොඳුරු ආඥාදායකයා යන අන්වර්තන නාමයෙන් හඳුන්වයි.
   3) අපේ කට්ටිය, නමින් නාට්‍ය කණ්ඩායමක් නිර්මාණය කර ඇත.
   4) දුන්නු දුනු ගමුවේ, තට්ටු ගෙවල්, මෝදර මෝල ඔහු විසින් අධ්‍යක්ෂණය කල නාට්‍ය කීපයකි.

26. දකුණුපස දක්වෙන ඡායාරූපයේ පෙන්වන රඟහල වන්නේ,




   1) ප්‍රොසීනියම් ආරුක්කු වේදිකාව
   2) ග්ලෝබ් රඟහල
   3) එරිනා රඟහල
   4) කැරකෙන වේදිකාව

27. සබරගමු සම්ප්‍රදායට අයත් යාතුකර්ම පමණක් දක්වෙන ප්‍රකාශය තෝරන්න.
   1) ගම්මඩු, දෙවොල් මඩු, රට යැකුම, කිරි මඩු
   2) පහන් මඩු, කිරි මඩු, පුනාමඩු, ගී මඩු
   3) කංකාරි මඩු, සූනියම්, හැල්ලුම් මඩු, ගම්මඩු
   4) ගරා යැකුම, පහන් මඩු, කිරි මඩු, කංකාරි මඩු


28. ක්ෂණික නිරූපන මගින් ඇතිවන ප්‍රයෝජනයක් වනුයේ,
   1) පරිකල්පන හැකියාව දියුණු කර ගත හැකි වීම.
   2) කටහඬ තීව්‍ර කර ගත හැකි වීම.
   3) අභිරූපණය කිරීමට හැකියාව ලැබීම.
   4) පිටපත් රචනයට හුරු වීමට හැකි වීම.

29. නාඩගම් නාට්‍ය කලාවේ ලක්ෂණයක් වනුයේ,
   1) එකදිගට දින 03 - 07 ක් අතර කාලයක් නාට්‍ය රඟ දැක්වීම.
   2) ප්‍රොසීනියම් ආරුක්කු වේදිකාව භාවිතා කිරීම.
   3) විවිධ වර්ණයේ විදුලි ආලෝක පහන් භාවිතය.
   4) සබේ විදානේ හෙවත් කාරියකරවන රාළ විසින් කතාව විකාශය කිරීම.

30. ජෝන් ද සිල්වා විසින් නිර්මාණය කරන ලද තූර්ති නාට්‍ය පමණක් දක්වෙන්නේ,
   1) පද්මාවතී, පණ්ඩුකාභය   2) රොලීනා, සිරිසඟබෝ
   3) දස්කොන්, දුටුගැමුණු   4) නාගානන්ද, ශ්‍රී වික්‍රම

- **31 සිට 35 තෙක් අසා ඇති ප්‍රශ්න වලට පහත රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.**


ක


ග


ජ



ට

31. "ක" ඡායාරූපයෙන් සම්බන්ධ නිවැරදි පිළිතුර වනුයේ,
   1) අණබෙර කෝලම   2) පේඩි කෝලම   3) හේවා කෝලම   4) ආරච්චි කෝලම

32. "ග" ඡායාරූපයෙන් දැක්වනුයේ,
   1) දහඅට සන්නියේ එන සන්නි වෙස් මුහුණකි.
   2) දහඅට සන්නියේ එන පාලි වෙස් මුහුණකි.
   3) කෝලම් නාටකයේ ජසයාගේ වෙස්මුහුණයි.
   4) සොකරි නාටකයේ එන පරයාගේ වෙස්මුහුණයි.

33. "ජ" ඡායාරූපයෙන් දැක්වෙන වෙස් මුහුණ වනුයේ,
   1) බිහිරි සන්නිය   2) අමුක්කු සන්නිය   3) කණ සන්නිය   4) මරු සන්නිය

34. "ට" ඡායාරූපයෙන් දැක්වනුයේ,
   1) සන්නි මුහුණකි.   2) පාලි මුහුණකි.
   3) කෝලම් මුහුණකි.   4) අධි මානුෂීය මුහුණකි.

35. "ග" සහ "ජ" සම්බන්ධ වෙස් මුහුණු හා බැඳි නිවැරදි ප්‍රකාශය වනුයේ,
   1) මුහුණු දෙකම කෝලම් වෙස් මුහුණුය.
   2) "ග" කෝලම් මුහුණක් වන අතර "ජ" සන්නි මුහුණකි.
   3) "ග" සොකරි වෙස් මුහුණක් වන අතර "ජ" කෝලම් මුහුණකි.
   4) මුහුණු දෙකම දහඅට සන්නියට අයත් වේ.

36. විශ්ව විද්‍යාල යුගයේ ඊ.එෆ්.සී. ලුඩෝ විසින් නිෂ්පාදනය කරන ලද නාටකයක් නොවනුයේ,
   1) Where Women Roul   2) The Servent Of Two Masters
   3) Right You are   4) Mother Courage

37. මිනර්වා නාට්‍ය සඳහා පුරෝගාමී වූ බී.ඒ.ඩබ්ලිව්. ජයමාන්නයන්ගේ නාට්‍ය සලකනු ලබනුයේ,
   1) ස්වතන්ත්‍ර නාට්‍ය ලෙසය   2) පරිවර්තන නාට්‍ය ලෙසය
   3) අසම්මත නාට්‍ය ලෙසය   4) අනුවර්තන නාට්‍ය ලෙසය

38. පත්තිනි පූජාව මුල් කර ගනිමින් පවත්වනු ලබන යාතුකර්ම වනුයේ,
   1) ගම්මඩු, පහන් මඩුව   2) කංකාරි මඩුව, දෙවොල් මඩුව
   3) දහ අට සන්නිය, සූනියම   4) හැල්ලුම් මඩු, බලියාගය

39. දකුණුපස ඡායාරූපයට අදාළ දර්ශනයෙන් පෙන්නුම් කරන නාට්‍ය වනුයේ,
   1) ජේමතෝ ජායතී සෝකෝ
   2) කදා වලලු
   3) මහාසාර
   4) රත්තරං



40. රංග භූමිය භාවිත කිරීමේදී අවධානයට ගතයුතු කරුණු පිළිබඳව වැරදි ප්‍රකාශය වනුයේ
   1) නාට්‍යයේ එන සිදුවීමට හේතුඵල සම්බන්ධතාව රැකෙන පරිදි නලු නිලියන් ස්ථානගත කලයුතුය
   2) රංගභූමියේ සමබරතාව රැකගත යුතුය
   3) රංග භූමියට යොදාඇති පැති තිර පිළිබඳව අවධානය යොමු කල යුතුය
   4) වේදිකා පසුතලය සඳහා හැකිතාක් ද්‍රව්‍ය යොදාගත යුතුය

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
මාතර අධ්‍යාපන කලාපය

**SOUTHERN PROVINCE – DEPARTMENT OF EDUCATION**
**ZONAL EDUCATION OFFICE – MATHARA**

අධීක්ෂණය
නිමල් දිසානායක මයා - (දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යකෂ)
එච්. එම්.චන්ද්‍ර කුමාර මයා - නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යකෂ (සෞන්දර්ය) මාතර කලාපය

නිබන්ධන සැකසුම
පී.එච්. නදීල් ශ්‍යාමන් - නාට්‍ය හා රංගකලාව ආචාර්ය (ශාරිපුත්‍ර විද්‍යාලය - මාතර)
සමපත් දායක - දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

| නාට්‍ය හා රංගකලාව<br>Drama And Theatre | 11 ශ්‍රේණිය<br>Grade 11 | කාලය පැය 03<br>Time 3 Hr |
|---|---|---|

# නාට්‍ය හා රංගකලාව II

➢ **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට (5) පිළිතුරු සැපයිය යුතුය.**

(01) පහත සංවාද ඛණ්ඩය ඇසුරු කර ගනිමින් අසා ඇති ප්‍රශ්ණවලට පිළිතුරු සපයන්න.

"අනේ දෙයියනේ මං මේ හැම දෙයක්ම කළේ මගේ හීන හැබෑ කර ගන්න විතරක් නොවෙයිනේ. දැන් කාලෙ දරුවන්ගේ අනාගතේ ගැන දෙමව්පියන්ට තියෙන රැකවරණය මොකක්ද? දොස්තර විභාගෙ පාස් වුනොත් දොස්තර හැටියට රස්සාවක් ලැබෙනව විශ්වාසයි..."

i. ඉහත සංවාද කොටස අන්තර්ගත නාටකයේ නම කුමක්ද? ලකුණු 2)
ii. එම නාටකයේ ඇති ජවනිකා/ අංක සංඛ්‍යාව කීයද? (ලකුණු 2)
iii. එම නාටකයේ නර්තන නිර්මාණය කරන ලද්දේ කවුරුන් විසින්ද? (ලකුණු 2)
iv. එම නාටකය මුල් වරට ප්‍රදර්ශනය කරන ලද්දේ කුමන ස්ථානයකද? (ලකුණු 2)
v. එම නාටකයේ අධ්‍යක්‍ෂකවරියගේ වෙනත් නාට්‍ය නිර්මාණ 2 ක් නම් කරන්න. (ලකුණු 2)
vi. මෙම නාටකයෙන් ලබාදෙන පණිවිඩය කුමක්ද? (ලකුණු 2)

(02) පහත ඡායාරූපය ඇසුරු කර ගනිමින් දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



i. ඡායාරූපයේ දැක්වෙන ගැමි නාටකය සහ චරිත දෙක නම් කරන්න. (ලකුණු 2)
ii. එම ගැමි නාටකයට අදාල උපත් කතාව සඳහන් කරන්න. (ලකුණු 4)
iii. සාම්ප්‍රදායිකව එම ගැමි නාටකය රංගගත කිරීමේ දී චරිත ඉදිරිපත් කරන පිළිවෙල සඳහන් කරන්න. (ලකුණු 6)

(03) i. ප්‍රාසාංගික කලාව යන්න කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 2)

ii. ප්‍රාසාංගික කලා ප්‍රභේද 04 ක් නම් කරන්න. (ලකුණු 4)

iii. ප්‍රාසාංගික කලාවන්ට පොදු වූ ලක්‍ෂණ පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 6)

(04) i. ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි නාට්‍ය ජනප්‍රිය කිරීමෙහිලා විශේෂ මෙහෙයක් ඉටු කල නාට්‍ය වේදියා කවුරුන්ද? (ලකුණු 2)

ii. ඔහු විසින් නිෂ්පාදනය කල ඉංග්‍රීසි නාට්‍ය 04 ක් සඳහන් කරන්න. (ලකුණු 4)

iii. වර්තමානයේ ජනප්‍රිය ලාංකික ඉංග්‍රීසි නාට්‍ය රචකයන් තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 6)

(05) i. නාට්‍යමය ලක්‍ෂණ සහිත වූ බෞද්ධ ආගමික වත්පිළිවෙත් 2 ක් සඳහන් කරන්න. (ලකුණු 2)

ii. එම වත්පිළිවෙත් වල ඇති නාට්‍යමය ලක්‍ෂණ 04 ක් දක්වන්න. (ලකුණු 4)

iii. එක් බෞද්ධාගමික වත් පිළිවෙතක් ඇසුරෙන් එහි නාට්‍යමය ලක්‍ෂණ විද්‍යාමාන වන ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 6)

(06) i. ප්‍රේක්‍ෂකයා යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2)

ii. නාට්‍යයකට ප්‍රේක්‍ෂක සහභාගීත්වය වැදගත්වන ආකාරය කරුණු 4 කින් දක්වන්න. (ලකුණු 4)

iii. ''ප්‍රේක්‍ෂකයා'' යනු රසිකයකු, විචාරකයකු මෙන්ම විනිශ්චය කරුවකු ද වේ. පැහැදිලි කරන්න. (ලකුණු 6)

(07) පහත දැක්වෙන කවිය පදනම් කරගෙන නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩනැගෙන පරිදි නාට්‍ය පෙලක් රචනා කරන්න. ඔබට කැමති පරිදි චරිත වල පුද්ගල නාම, ස්ත්‍රී පුරුෂ බව හෝ චරිත සංඛ්‍යාව වෙනස් කර ගත හැකි වේ.

පාසලට යන එන
අතරමඟ දී කිසි තැන
කෝලහල නොකරමින
ගමන් කරපන් සිල්වතෙකු මෙන

i. පසුබිම කාලය හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමඟ සංවාද රචනා කිරීම සඳහා (ලකුණු 4)

ii. චරිත අතර ගැටුමක් ඇති වන අයුරින් අවස්ථාව ගොඩනැගීම සඳහා (ලකුණු 4)

iii. දෙගිඩියාව, කුතුහලය, උත්ප්‍රාසය සහිත නාට්‍යෝචිත අවස්ථාවන් නිර්මාණය කිරීම සඳහා (ලකුණු 4)

***

## පිළිතුරු පත්‍රය - ඇගයීම් අංක - 06

### නාට්‍ය හා රංගකලාව - I

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1) | 2 | 11) | 4 | 21) | 1 | 31) | 3 |
| 2) | 3 | 12) | 1 | 22) | 3 | 32) | 1 |
| 3) | 1 | 13) | 2 | 23) | 1 | 33) | 3 |
| 4) | 2 | 14) | 3 | 24) | 4 | 34) | 3 |
| 5) | 2 | 15) | 1 | 25) | 4 | 35) | 4 |
| 6) | 1 | 16) | 3 | 26) | 3 | 36) | 4 |
| 7) | 2 | 17) | 1 | 27) | 2 | 37) | 1 |
| 8) | 3 | 18) | 4 | 28) | 1 | 38) | 1 |
| 9) | 3 | 19) | 1 | 29) | 1 | 39) | 2 |
| 10) | 1 | 20) | 3 | 30) | 3 | 40) | 4 |

### නාට්‍ය හා රංගකලාව - II

(01)
i. විකෘති නාට්‍ය
ii. 10 යි
iii. සෝමලතා සුබසිංහ මහත්මිය
iv. කොළඹ ලයනල් වෙන්ට්ඩ් රඟහලෙහි
v. 
- පුංචි අපට දූන් තේරෙයි
- තොප්පි වෙළෙන්දා
- හිම කුමාරි

vi. විභාග රටාව කේන්ද්‍ර කරගත් නූතන තරඟකාරී අධ්‍යාපන ක්‍රමය යටතේ වියැකී යන තාරුණ්‍යය

(02)
i. කෝලම් නාටකය / අණබෙර කෝලම (පණික්කිරාළ) සහ නොංචි කෝලම

ii. මහා සම්මත රජුගේ බිසවට නැටුම් බැලීමේ අරුම පුදුම දොළ දුකක් ඇතිවිය. නොයෙක් ප්‍රදේශයන් ගෙන් නැට්ටුවන් ගෙන්වා රඟුම් දැක්වුවද පලක් නොවිනි. ඇයට ඇති වූයේ වෙස් මුහුනු ලා ගත් නැට්ටුවන්ගේ නර්තනයන් නැරඹීමේ ආශාවකි. මේ නිසා රජු සිත් තැවුලට පත්ව සිටියේය. රජු කෙරෙහි අනුකම්පා කල පරිවාර දේවතාවියක් ඒ පිළිබඳව සක්‍ර දෙවියන්ට දැන්වීය. රජු කෙරෙහි අනුකම්පා කල සක් දෙවිඳු විශ්වකර්ම දිව්‍යපුත්‍රයා ලවා සඳුන් ලීයෙන් වෙස්මුහුණු නිර්මාණය කොට ඒවා පැලඳ රඟ දක්වන ආකාරය විස්තර කෙරෙන පොතක්ද සමග රජුගේ උයනේ තබා ගියේය. එම වෙස්මුහුනු පැලඳ සිදු කරන ලද නැටුම් දැක බිසවට සිනා පහල වී දොල දුක සංසිඳී ඇත.

iii.
- තොරතුරු කතා කාරයා කාරිය කරවන රාළ හෙවත් සබේ විදානෙ සබයට පැමිණීම.
- පූර්ව රංගනය ඉදිරිපත් කිරීම.
  - අණබෙර කෝලම
  - නොංචි කෝලම
  - හේවා කෝලම
  - පොලිස් කෝලම
  - ආරච්චි කෝලම
  - පේඩිරාල හෙවත් ජස කෝලම හා ලෙන්චිනා
  - මුදලි කෝලම
- අපර රංගනය ඉදිරිපත් කිරීම.
  - මහා සම්මත රජු සහ බිසව සබයට පැමිණීම.
  - සත්ව චරිත පැමිණීම (ගොන්, කොටි, සිංහ, වලස් ආදිය )
  - රාක්‍ෂ චරිත පැමිණීම (ගුරුළු රාක්‍ෂ, නාග රාක්‍ෂ, මරු රාක්‍ෂ ආදිය.)
  - අවසානයේ කෝලම් කතා රඟ දැක්වීම. (සඳ කිඳුරු කතාව මනමේ කතාව ගොඨයිම්බර කතාව)

(03)
i. ප්‍රේක්ෂක පිරිසක් ඉදිරියේ වේදිකාවක් මත ජීවමානව ඉදිරිපත් කරනු ලබන කලාව ප්‍රාසාංගික කලාව නමින් හඳුන්වනු ලබයි.

ii. නාට්‍ය, සංගීතය, නර්තනය, මුද්‍රා නාට්‍ය, ඔපෙරා, බැලේ නාට්‍ය, රූකඩ සංදර්ශන

iii. ප්‍රාසාංගික කලාවන් අතරින් නාට්‍ය කලාවට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. උක්ත සඳහන් කරන ලද ප්‍රාසාංගික කලා අතරින් නාට්‍ය කලාව සුවිශේෂී වීමට කරුණු රැසක් පවතී. එනම්,

- සංගීතය, නර්තනය වැනි අනෙකුත් ප්‍රාසාංගික කලාවන් නාට්‍ය කලාව තුළ අන්තර්ගත වීම.

  නාට්‍යයක නිර්මාණ ක්‍රියාවලියේ රස තීව්‍ර කිරීම සඳහා අනෙකුත් ප්‍රාසාංගික කලාවන් යොදාගනී. නාට්‍ය කලාව සුවිශේෂී වීමට ප්‍රධාන කරුණක් ලෙස මෙය පෙන්වා දිය හැකිය. මෙහිදී සංගීතය, නර්තනය වැනි අනෙකුත් ප්‍රාසාංගික කලාවන් නාට්‍ය කලාව තුළ දක්නට ලැබේ. එනම් නාට්‍යයක් අතරතුර නර්තනය යොදා ගැනීම නාට්‍ය තුළ ගීත ගායනා යොදා ගැනීම ආදිය තුලින් එය මනාව ගම්‍යමාන වේ. එසේ සියලුම ප්‍රාසාංගික කලාවන්ගේ එකතුවක් වන නාට්‍ය කලාව අනෙකුත් ප්‍රාසාංගික කලාවන් අතරින් වඩාත් සුවිශේෂී වේ

- සාමූහික ක්‍රියාවලියක් වීම.

  ඒ.බී. මොග්ලි නම් නාට්‍යකරුවා නාට්‍ය කලාව විග්‍රහකොට ඇත්තේ සාමූහික කලාවක් ලෙසය. මෙහිදී නාට්‍යයක් වූ කලී සාමූහික ක්‍රියාවලියක් බව ඔබට ගම්‍යමානවේ. එනම් කලාකරුවන් රැසකගේ මෙන්ම කලා ශිල්පීන් රැසකගේ එකතුවෙන් නාට්‍යයක් සිදුකරනු ලබයි. වෙනත් ප්‍රාසාංගික කලා ගත්කළ ඒවා තනි තනිව වුවද රඟ දැක්විය හැකිවේ. එහෙත් නාට්‍යයක් වූ කලී අනිවාර්යයයෙන්ම සාමූහික ක්‍රියාවලියක් වේ. එමෙන්ම තිරය පිටුපස සිට වේදිකා සහයකවරු, පෙළ මතක් කරන්නන්, තිරය ක්‍රියා කරන්නන් ආදී රැසක් නාට්‍යමය ක්‍රියාවේ සාර්ථකත්වයට සම්බන්ධ වේ.

- පෙළ රචනයක් තිබීම.

  පෙළ රචනය යනු ''නාට්‍ය පිටපතය''. නාට්‍ය පිටපත තුළ නාට්‍යයේ ගලායාම සියල්ලම අන්තර්ගත වේ. මෙවැනි පිටපතක් නර්තනය, සංගීතය මෙන්ම අනෙකුත් ප්‍රාසාංගික කලාවන් සඳහා නොමැත. එනම් පිටපතකට අනුව නර්තනයක්, සංගීතයක් හෝ අනෙකුත් ප්‍රාසාංගික කලාවන් සිදු නොකරයි. එමගින් නාට්‍ය කලාව සුවිශේෂී වන බව අපට ගම්‍යමාන වේ.

- සතර අභිනයම භාවිතා කිරීම.

  නාට්‍ය කලාවේ ප්‍රධාන මාධ්‍ය වනුයේ අභිනයයි. එනම් ආංගික, සාත්වික, වාචික හා ආහාර්ය යන සතර අභිනයම නාට්‍ය කලාව තුළ අන්තර්ගත වේ. ආංගික අභිනය හෙවත් අඟ පසඟ මගින් අභිනය පෑම, සාත්වික හෙවත් මුහුණේ අඟ පසඟ මගින් අභිනය පෑම, වාචික හෙවත් වචන හා සංවාද භාවිතය මගින් අභිනය පෑම හා ආහාර්ය අභිනය හෙවත් ඇඳුම් පැලඳුම්, විදුලි ආලෝකකරණය ආදී පිටතින් ගෙනඑන ලද ආනුශාංගික අංග ආදිය නාට්‍ය කලාව තුළ ප්‍රධාන වශයෙන්ම අන්තර්ගත වන බව අපට ගම්‍යමානවේ. මෙකී සියලුම අභිනයන් එකවර අනෙකුත් ප්‍රාසාංගික කලාවන් තුළ අන්තර්ගත නොවේ.

- නාට්‍යෝචිත අවස්ථා අන්තර්ගත වීම.

  නාට්‍යයක් වූ කලී එහි කතා වස්තුවක් විද්‍යාමාන වුවද එය මුල සිට අගට කතාවක් කීම සිදු නොවේ. තෝරාගත් කතා පුවතේ ඇතුළත් නාට්‍යෝචිත අවස්ථා වේදිකාව මත ප්‍රතිනිර්මාණය කිරීමකි. උදාහරණ ලෙස මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ සිංහබාහු නාටකයට පදනම් වී ඇත්තේ සිංහල ජාතියේ උපතට සම්බන්ධ මහාවංශයේ එන ඉතිහාස කතාවයි. එම කතාව නාටකයේ මුල සිට අගට ඉදිරිපත් නොවන අතර ගිරිලෙන් වාසය, ලෙන්දොර හැරයාම, සිංහයා ගම් නියම්ගම් වැනසීම, සිංහයා මැරීම යනුවෙන් නාට්‍යෝචිත අවස්ථා 4 ක් ඔස්සේ කතාව විකාශනය වේ.

(04) i. ඒ.එෆ්.සී. ලුඩෝවයික්

ii. Where Women Rule - ක්වින්ටෙරෝ සහෝදරයෝ
The Rivals - ෂෙරිඩන්
Imaginay Invalid - මෝලියර්
The Ladies From Alfaqueque - ක්වින්ටෙරෝ සහෝදරයෝ
The Servant of Two Masters - කාලෝ ගොල්ඩොනි
Arms and the Man - බර්නාඩ් ෂෝ
The Red Maned Steed - Hsiung චීන නාට්‍යකරු
The Merry Wives of Windsor - ශේක්ෂ්පියර්
Peace and Quiet - ක්වීන්ටෙරෝ සහෝදරයෝ
Marco Millions - යූජින් ඔනිල්
The Simpletion ton of the Unexpected Isles - බර්නාඩ් ෂෝ
Right you are (If you think so) - ලුයිජි පිරැන්ඩෙලෝ

iii. ජෙහාන් ඇලෝසියස්, ඉන්දු ධර්මසේන, රුවන්ති ඩී. චිකේරා, ජෙරොම් ද සිල්වා

(05) i. දොරකඩ අස්න / ආලවක දමනය / යුගාසන ධර්ම දේශනය / මිලින්ද ප්‍රශ්නය
ආදාහන පූජෝත්සවය / උපසම්පදා මංගල්‍යය / පිරිත් පිංකම්

ii. අනුකරණය / සමාරෝපය / සංවාද භාවිත කිරීම / රංග භාණ්ඩ භාවිතය / පසුතල නිර්මාණ භාවිතය /
ප්‍රේක්ෂක සහභාගීත්වය / ප්‍රේක්ෂක ප්‍රතිචාර ලැබීම

iii. බෞද්ධාගමික වත් පිළිවෙත්හි ප්‍රධාන පරමාර්ථය උවැසි උවැසියන්ට ආගමික නැඹුරුවක් ඇති කරමින් බෞද්ධාගමික ධර්ම කරුණු පහදා දීමයි. නමුත් ජනප්‍රිය බුදු සමය තුළ ඊට නාට්‍යමය ලක්ෂණ එක් කර ඇත. එවැනි බෞද්ධාගමික වත් පිළිවෙතක් ලෙස දොරකඩ අස්න කීම ගත හැකිය. එහිදී කුඩා පිරිමි ළමයකු දේවදූතයකු ලෙසද තවත් කුඩා පිරිමි ළමුන් කිහිපදෙනෙකු දේවදූතයාගේ ආරක්ෂාවට යන මුර භටයන් ලෙසද වෙස් වලා ගනිමින් දොරකඩ අස්න කීම පැවැත්වෙන විහාරස්ථානයේ සිට සවස් කාලයේ දේව ආරාධනාවක් සඳහා පෙරහැරින් පිටත් වේ. එය සමාරෝපය නම් නාට්‍යමය ලක්ෂණය මතු කරයි. සමාරෝපය යනු, වෙස් වලා ගැනීමයි. මෙහිදී කුඩා පිරිමි ළමුන් දේවදූතයා හා මුරභටයින් තම ප්‍රකෘති ස්වභාවයෙන් මිදී අදාළ චරිතයට වෙස් වලාගෙන සිටී.

එමෙන්ම එහිදී ඔවුන් පෞද්ගලික චර්යාවන්ගෙන් මිදී එම චරිත වලට අදාළ හැසිරවීම් රටා අනුකරණය කරයි. එමෙන්ම සංවාද භාවිතය නම් නාට්‍යමය ලක්ෂණයද දොරකඩ අස්න කීම තුළ දැකිය හැකිය. රාත්‍රී 8 ට පමණ පිරිත් මණ්ඩපය දොරටුව අසලට පැමිණෙන දේවදූතයා මණ්ඩපය තුළ සිටින දේශක භික්ෂුව සමඟ සංවාදයේ යෙදේ.

දේශක භික්ෂුව :- විචිත්‍ර වර්ණෝප ශෝභිත වූ මෙම මණ්ඩප ද්වාරයෙහි මිනිස්සු ඇත.
දේවදූතයා :- සව් ශීලාද්‍යාදී අමිත ගුණ සණාංගයෙන් උපලක්ෂිත වූ පින්වත් ස්වාමීන් වහන්ස විචිත්‍ර වර්ණෝප ශෝභිත වූ මෙම මණ්ඩප ද්වාරයෙහි මිනිස්සු ඇත.

එමෙන්ම රංග භාණ්ඩ භාවිතය නම් නාට්‍යමය ලක්ෂණයද එහිදී දැකිය හැකිවේ. කෙසේද යත් දේවදූතයාගේ කරෙහි කඳක් දක්නට ලැබේ. එමෙන්ම මුර භටයන්ගේ අත්වල කඩු ඇති අතර ඒවා රංග භාණ්ඩ ලෙස ගත හැකිවේ. දේවදූතයාගේ කඳෙහි ඇත්තේ දේවාල තල්පත්‍රය. දේවාල තල්පත් යනු දෙවි දේවතාවන් උදෙසා තල්කොළ වලින් සකසන ලද ආරාධනා පත්‍රය.

එමෙන්ම පිරිත් මණ්ඩපය සැරසීම ධර්මශාලාව සැරසීම වේදිකා අලංකරණ භාවිතයට ද විටින් විට හේවිසි වාදනය කිරීම පසුබිම් සංගීතයකට සමාන වන අතර සැදැහැවත්තු නගන සාදු නාද ආදිය ප්‍රේක්ෂක ප්‍රතිචාර ලෙස ගත හැකිය.

(06) i. ප්‍රේක්ෂකයා යනු, නාට්‍ය නරඹා රස විඳින පිරිස වේ. බොහෝ විට ප්‍රේක්ෂකයා වූ කලී විවිධ අදහස් දරණ විවිධ රසයන්ට කැමති වූ පිරිසකි. ඔවුන් සියලු දෙනාම ඒකරාශී වන්නේ ප්‍රේක්ෂකාගාරයක් තුළටය. මෙහිදී ප්‍රේක්ෂකයා තමාගේ තරාතිරම, බුද්ධිය හා අධ්‍යාපන මට්ටම අනුව නාට්‍ය රස විඳීමට ක්‍රියා කරයි.

ii.
- නාට්‍යයක ඉදිරි පැවැත්මට හේතු වන්නාවූ පිරිස ප්‍රේක්ෂකයා වන නිසාවෙන් ප්‍රේක්ෂක සහභාගීත්වය වැදගත් වේ.
- නාට්‍ය සජීවී ප්‍රාසාංගික කලාවක් වන නිසාවෙන් ප්‍රේක්ෂක සහභාගීත්වය වැදගත්වේ.
- නාට්‍යයකට අවශ්‍ය විචාරක පිරිස රැඳී සිටිනුයේ ප්‍රේක්ෂකාගාරයේය.
- නාට්‍යයක විනිශ්චයකරුවන් පිරිස ප්‍රේක්ෂකාගාරයේ සිටීම.
- නාට්‍ය කලාවේ අනාගත ගමන්මඟ පෙන්නුම් කරන සාධකය ප්‍රේක්ෂකයා වීම.
- නාට්‍යයකට හොඳ හෝ නරක ප්‍රතිචාර දක්වනුයේ ප්‍රේක්ෂකයා වීම.

iii. විලියම් ආචර් පඬිවරයා නාට්‍ය කලාව නිර්වචනය කර ඇත්තේ ප්‍රේක්ෂක සහභාගීත්වයෙන් තොර නාට්‍ය කලාව අර්ථ ශූන්‍ය වේ යනුවෙනි. ඒ අනුව නාට්‍යයක නාට්‍යමය ක්‍රියාවලිය උදෙසා අත්‍යාවශ්‍ය සාධකය වනුයේ ප්‍රේක්ෂකයාය. එහිදී ප්‍රේක්ෂකයා වූ කලී රසිකයෙකුවේ. එනම් නාට්‍යයක් නිර්මාණය කරනු ලබන්නේ ප්‍රේක්ෂකයාගේ රසවින්දනය ප්‍රධාන අරමුණ කර ගනිමින්ය. ප්‍රේක්ෂකයා නාට්‍යයකට බද්ධ වනුයේ එහි ඇති අපූර්වත්වය සමඟ දැනෙන්නාවූ රසය නිසාවෙනි. එමෙන්ම ප්‍රේක්ෂකයා වූ කලී විචාරකයකු ද වේ. විචාරණය වූ කලී හොඳ හෝ නරක දෙයාකාරයෙන්ම ස්වකීය අදහස් දක්වන්නකි. ඒ අනුව එහිදී ප්‍රේක්ෂකයා තම නැණ පරිදි නාට්‍ය නිර්මාණයන්ට විචාරණයක්ද දක්වයි. එහෙයින් ප්‍රේක්ෂකයා විචාරකයකුද වේ. එමෙන්ම ප්‍රේක්ෂකයා විනිශ්චයකරුවකු ද වේ. එනම් නාට්‍යයේ චරිත සහ අවස්ථාවන්හි ක්‍රියාකාරීත්වය පිළිබඳව ප්‍රේක්ෂකයාට යම් යම් විනිශ්චයන් සැපයිය හැකිය. සමහර අවස්ථා වලදී නාට්‍යකරුවෝ විසින් ප්‍රේක්ෂකයා හිතාමතා විනිශ්චයකරුවකු බවට පත් කරයි. උදාහරණයක් ලෙස සරච්චන්ද්‍රයන් මනමේ නාටකයේදී මනමේ කුමරුගේ මිය යාම පොතේ ගුරු විසින් ''අනේ ඒ විපත සිදුවුනු නොදනිමි කාගේ දොසා..'' යනුවෙන් ප්‍රකාශ කරයි. ඒ තුළ එකී අවස්ථාව පිළිබඳ ප්‍රේක්ෂකයාට විනිශ්චය කිරීමට අවස්ථාව නිර්මාණකරුවා ලබා දී ඇත. එහෙයින් ප්‍රේක්ෂකයා රසිකයකු, විචාරකයකු, විනිශ්චයකරුවකු ද වේ.

(07) (වේදිකාව තුළ උදෑසන මහාමාර්ගයක ස්වරූපයක් ගනී. පාසල් යන සිසු සිසුවියන් බොහෝ පිරිසක් පාර දෙපස ඒ මේ අත දුවමින් පාසල වෙත යන ආකාරයක් පෙනේ.)

කමල් :- ශාන්ත අපි පොඩි වැඩක් කරමුද?

එරංග :- මොකක්ද? මොකද්ද ..... කාටද? චාමරගෙ ගැන්සියටද?

ශාන්ත :- ඔව් ඕකගෙ ගැන්සියේ ඔලුව වැඩියි අරකෙන් පස්සේ අපි උන්ට හොඳ වැඩක් කරමු.

කමල් :- එළියට ගනින් අර වතුර පැකට් ටික.

(කමල්, එරංග හා ශාන්ත තම බෑගයන් තුළ තිබූ බෑග් වලට පිරවූ වතුර බෑග් එළියට ගනිමින් හයියෙන් සිනාසේ. තවත් පසෙකින් චාමර කණ්ඩායමේ සාමාජිකයින් ඉතා අහිංසක ලෙස පාසලේ යම් කටයුත්තක් පිළිබඳව සාකච්ඡා කරමින් පාරේ දකුණු පසින් ගමන් කරමින් සිටී.)

කමල් :- ගහපිය ඔය සේරම නෑවිලා යන්න.

(ශාන්ත හා එරංග අතට ගත් වතුර බෑග් වලින් චාමරගේ කණ්ඩායමේ සිටි සාමාජිකයන්ට එලවා එලවා පහර දෙන්නට විය.)

චාමර :- කමල් මොකද්ද බං මේ කළේ. උඹලට මොකද්ද අපි කරපු වැරැද්ද? බලපන් ඉස්කෝලෙ යන්නේ කෙහොමද කියල අපි.

ශාන්ත :- අඩෝ... උඹලගේ ඔලුව වැඩියි. උඹලට විතරයි ඉස්කෝලෙ තැන. අපි මොකුන්ද?

සංගීත් :- ඉස්කෝලේ යන විදියට ඉස්කෝලෙ පලයන්. අහිංසක උන්ට කරදර නොකර පාරේවත් යන්න දන්නේ නෑ.

(දෙපිරිස අතර පාර දෙපස දැඩි කලකෝලහාලයක් හට ගනී.)

චාමර :- ශාන්ත උඹලා ගැන අපි බලාගන්නම්. අපිට උඹලා එක්ක තරඟයක් නෑ. අපිට අපේ පාඩුවේ ඉස්කෝලෙ යන්න දීපන්.

කමල් :- උඹලට එදා ඉස්කෝලෙදි කරපුව මතකයිනෙ. මැඩම් අපිට එදා හොඳටම තඩිබෑවා.

චාමර :- ආයිත් උඹලා මේ වගේ පාරේදි හම්බවුනොත් මීට වඩා වැඩිවෙයි.

(කමල් හා චාමරලාගේ කණ්ඩායම අතර බහින් බස් වීම වඩා තීව්‍ර වීමෙන් පසු චාමරගේ කණ්ඩායමේ සාමාජිකයකුට හිසට පහරක් වැදීමෙන් ඔහු රෝහලට ගෙන යයි.)

(මෙම නාට්‍ය පිටපත් ආකෘතිය ආදර්ශයට ගනිමින් දී ඇති සිදුවීම කැමති අවසානයක් කරා රැගෙන යමින් වේදිකාවේ රංගනයට උචිත පරිදි පිටපත රචනා කරන්න. මෙය නාට්‍ය පිටපත් ආකෘතියක් පමණක් බව සලකන්න.)

***